UNION ASSURANCE

# Flex Life

## ඔබේ ප්‍රගතිය, ඔබට රිසි ලෙස



යුනියන් ඇෂුවරන්ස්
ජෝන් කීල්ස් සමාගමකි



ඔබේ මූල්‍ය අරමුණ කුමක් වුවත්, ජීවිතයේ අනපේක්ෂිත සහ අභියෝගාත්මක නිමේෂයයන් පරිපූර්ණවූත්, නම්‍යශීලීවූත් මූල්‍යමය රැකවරණයක අවශ්‍යතාවය අපට පසක් කර දෙයි.

Union FlexLife යනු අසමසම නම්‍යශීලීත්වය, පරිපූර්ණ මූල්‍ය රැකවරණය සහ ආකර්ෂණීය ප්‍රතිලාභ යන සියල්ල එකට කැටිවූ සුවිශේෂී ජීවිත රක්ෂණ සැලසුමකි.

## මූල්‍යමය වශයෙන් සුරක්ෂිත හෙට දිනකට නම්‍යශීලී ජීවිත රක්ෂණ සැලසුමක්

ඔබටම සුවිශේෂී වු ප්‍රගතිය කරා යන ගමන් මගෙහි මූලික අවස්ථා පහක් වන විශ්‍රාමය, රැකවරණය, ආයෝජන, අධ්‍යාපනය සහ සෞඛ්‍යය සඳහා අවශ්‍ය වන අසමසම මූල්‍ය සුරක්ෂිතතාවය හිමිකර දීම පිණිස Union FlexLife ජීවිත රක්ෂණ සැලසුම නිර්මාණය වී ඇත.

### විශ්‍රාමය

මූල්‍යමය නිදහස, රැකවරණය සහ මානසික සුවය සපිරි විශ්‍රාම දිවියක් ගොඩනගා ගැනීමට අත්වැලක් සපයයි.

### රැකවරණය

ජීවිතයේ අභියෝගාත්මක නිමේෂයන්හීදී, ඔබට සහ ඔබගේ ආදරණීයයන්ට අත්‍යවශ්‍ය වන මූල්‍යමය රැකවරණය සපයයි.

### ආයෝජන

ඔබ වෙහෙස මහන්සියෙන් ඉපයූ මුදල්, ආකර්ෂණීය ලාභාංශ සමඟ වර්ධනය වීමට ඉඩ සලසන අතරම, කල්පිරීමේදී හිමිවන ආකර්ෂණීය ප්‍රසාද දීමනාව හරහා, ඔබට ලබාදිය හැකි ඉහළම ප්‍රතිලාභ හිමිකර දෙයි.

### අධ්‍යාපනය

ජීවිතයේ අභියෝගාත්මක අවස්ථාවන්හීදී, ඔබේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු බාධාවකින් තොරව අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය වන මූල්‍යමය රැකවරණය සපයයි.

### සෞඛ්‍යය

හදිසි වෛද්‍ය අවශ්‍යතාවයකදී මූල්‍යමය රැකවරණය සලසමින්, නිසි මොහොතේදී වෛද්‍ය ප්‍රතිකාර කරා යොමුවීමට ඉඩ සළසයි.

## ඔබ Union FlexLife ජීවිත රක්ෂණ සැලසුමක් තෝරාගත යුත්තේ ඇයි?



### කෙටිකාලීන ආයෝජනයක්, දිගුකාලීන රැකවරණයක්

Union FlexLife ජීවිත රක්ෂණ සැලසුමක් ආයෝජනය සඳහා තෝරාගන්නා ඔබ, වාරික ගෙවිය යුතු වන්නේ රක්ෂණ සැලසුමෙහි මුල් වසර 5, 7 හෝ 10 සඳහා වේ. තවද, ඔබට වසර 40 ක් දක්වා වූ උපරිමයකට යටත්ව, රක්ෂණ සැලසුම් කාලසීමාව ලෙස වසර 10 - 40 ත් අතර ඕනෑම අගයයක් තෝරාගත හැක.



### කල්පිරීමේ ප්‍රතිලාභය ඔබ කැමති ආකාරයකට ලබාගන්න

Union FlexLife කල්පිරීමේ ප්‍රතිලාභය ඔබගේ අභිමතය පරිදි ලබාගැනීමට ඉඩ සලසයි. මේ අනුව එකී ප්‍රතිලාභය සැලසුම් කාලසීමාව අවසානයේ එකවර මුළු මුදලක් ලෙස (Lump sum) හෝ කොටස් වශයෙන් මාසික ආදායමක් ලෙස (Annuity) ලබාගැනීමේ අවස්ථාව හිමිවේ.



### අනපේක්ෂිත අභියෝග හමුවේ වුවද සහතික කළ ප්‍රතිලාභ

රක්ෂණ සැලසුම් කාලසීමාව තුළ සිදුවන ජීවිත රක්ෂිතයාගේ අනපේක්ෂිත වියෝවකදී, මරණ ප්‍රතිලාභය ප්‍රතිලාභීන්ට හිමිවන අතර, සැලසුමට අන්තර්ගත ජීවිත රක්ෂිතයාගේ වියෝවකදී වාරික ගෙවීමෙන් නිදහස් කිරීමේ ප්‍රතිලාභය හරහා අරමුදල බාධාවකින් තොරව වර්ධනය වීමට ඉඩ සලසමින්, කල්පිරීමේදී අපේක්ෂිත ප්‍රතිලාභ හිමිකර දෙයි.

තවද, රක්ෂණ සැලසුම් කාලසීමාව තුළ ජීවිත රක්ෂිතයා මුහුණ දෙන පූර්ණ නිත්‍ය අකර්මණ්‍යතාවයකදී, සැලසුමට අන්තර්ගත වාරික ගෙවීමෙන් නිදහස් කිරීමේ ප්‍රතිලාභය සක්‍රීය වී, බාධාවකින් තොරව අරමුදල වර්ධනය වීමට ඉඩ සලසමින්, කල්පිරීමේදී අපේක්ෂිත ප්‍රතිලාභ හිමිකර දෙයි.



### ඔබට වඩාත් පහසු වාරික ගෙවීමේ ක්‍රමයක් තෝරාගන්න

ඔබේ අනෙකුත් මූල්‍ය වගකීම්වලට ගැළපෙන පරිදි වඩාත් පහසු වාරික ගෙවීමේ ක්‍රමයක් තෝරාගැනීමේ අවස්ථාව Union FlexLife ජීවිත රක්ෂණ සැලසුම හරහා ඔබට හිමිවේ. ඒ අනුව ඔබට මාසික, කාර්තුමය, අර්ධ-වාර්ෂික, වාර්ෂික යන ක්‍රම අතුරින් එකක් තෝරාගත හැක.

### ඔබ දන්නවාද?

Union FlexLife ජීවිත රක්ෂණ සැලසුම ඔබට අතිරේක අරමුදල් ඇති අවස්ථාවකදී තනි වාරික ආයෝජන (Top- Ups) හරහා, ඔබගේ අරමුදල තවත් ඉහළ නංවා ගැනීමට අවස්ථාව හිමිකර දෙයි.

රක්ෂණ සැලසුම් කාලසීමාවෙහි තුන්වන වසර සම්පූර්ණ කිරීමෙන් පසු, ඔප්පු වර්ෂයකට දෙවතාවක් (02) දක්වා වූ උපරිමයකට යටත්ව තනි වාරික (Top-Ups) ආයෝජනය කළ හැකි අතර, එක් අවස්ථාවකදී ආයෝජනය කළ හැකි අවම තනි වාරිකය රු. විසි පන්දහසක් (25,000) වේ.

**සැලකිය යුතුයි:**

- වසර 5, 7 හෝ 10 සඳහා පමණක් වාරික ගෙවීම වලංගු වනුයේ මරණ ප්‍රතිලාභය, ජීවිත රක්ෂිතයාගේ වියෝවකදී වාරික ගෙවීමෙන් නිදහස් කිරීමේ ප්‍රතිලාභය, පූර්ණ නිත්‍ය අකර්මණ්‍යතාවයකදී වාරික ගෙවීමෙන් නිදහස් කිරීමේ ප්‍රතිලාභය සහ සීමිත ගෙවීම් අවශ්‍ය වන අතිරේක ආවරණ සඳහා පමණක් වේ. සාමාන්‍ය ගෙවීම් අවශ්‍ය වන අතිරේක ආවරණ තෝරාගැනීමකදී, එකී අතිරේක ආවරණ ආවරණ කාලසීමාව පුරාවට වාරික ගෙවීම සිදුකළ යුතු වේ.
- රක්ෂණ සැලසුම් කාලසීමාවට අදාළ වන සියලුම වාරික ගෙවා ඇත්නම්, කල්පිරීමේදී හිමිවන ප්‍රසාද දීමනා වටිනාකම (Loyalty Bonus), ඔබ තෝරාගන්නා මරණ ප්‍රතිලාභ වටිනාකම සහ රක්ෂණ සැලසුම් කාලසීමාව මත නිර්ණය වේ.

# ඔබ Union FlexLife ජීවිත රක්ෂණ සැලසුමක් තෝරාගත යුත්තේ ඇයි ?



### මූල්‍යමය වශයෙන් සුරක්ෂිත විශ්‍රාම දිවියක්

Union FlexLife ජීවිත රක්ෂණ සැලසුමක ආයෝජනය කරන ඔබට, ඔබේ විශ්‍රාම වයස ලෙස අවුරුදු 28-70 අතර ඕනෑම අගයයක් තෝරාගත හැකි අතර - මාසික ආදායමක් ලෙස ලබාගත හැකි කල්පිරීමේ ප්‍රතිලාභය හරහා මූල්‍යමය සුරක්ෂිතතාව සහ මානසික සුවය සපිරි විශ්‍රාම දිවියක් හිමිකර දෙයි.



### කල්පිරීමේදී ඔබට ආකර්ෂණීය ප්‍රසාද දීමනාවක්

රක්ෂණ සැලසුම් කාලසීමාව සඳහා අදාළ වන සියලුම වාරික ගෙවා ඇත්නම්, ඔබේ ආයෝජනය සඳහා ඉහළම ප්‍රතිලාභ හිමිවන පරිදි, ආකර්ෂණීය ප්‍රසාද දීමනාවක් සැලසුම කල්පිරීමේදී හිමිවනු ඇත.



### ඔබටම අනන්‍ය වූ රක්ෂණ සැලසුමක් නිර්මාණය කරගන්න

Union FlexLife ජීවිත රක්ෂණ සැලසුමට අතිරේක ආවරණ අවස්ථා රැසක් අන්තර්ගත අතර, මේ හරහා රක්ෂණ සැලසුම ඔබට අනන්‍ය ලෙස නිර්මාණය කරගැනීමේ සුවිශේෂී අවස්ථාව හිමිවේ. අතිරේක ආවරණ ලෙස රෝහල්ගතවීම් ආවරණ, ආදායම් අහිමිවීම් ආවරණ, අකර්මණ්‍යතා ආවරණ සහ අමතර ජීවිත ආවරණ රක්ෂණ සැලසුමට එක් කරගත හැක.



### කල්පිරීමේ ප්‍රතිලාභ ලබාගන්නා කාලය ඔබම තෝරාගන්න

කොටස් වශයෙන් මාසික ආදායමක් ලෙස කල්පිරීමේ ප්‍රතිලාභ ලබාගැනීමට තීරණය කරන ඔබට, එකී ප්‍රතිලාභ අවශ්‍ය වන කාලසීමාව තෝරාගැනීමේ නිදහසත්, නම්‍යශීලීත්වයත් Union FlexLife ජීවිත රක්ෂණ සැලසුම හරහා ඔබට හිමිවේ. මේ අනුව වසර 10, 15 සහ 20 යන අවස්ථා අතුරින් එකක් ඔබේ අභිමතය පරිදි තෝරාගත හැක.

### ඔබ දන්නවාද ?

ඔබට ඇතිවන හදිසි මූල්‍ය අවශ්‍යතාවයකදී Union FlexLife ඔබේ ආයෝජන ගිණුමෙන් කොටස් වශයෙන් මුදල් ලබාගැනීමට (Partial Withdrawals) ඉඩ සලසයි.

මේ අනුව රක්ෂණ සැලසුම ආරම්භක දිනයේ සිට අවුරුදු දහය (10) ඉක්මවීමෙන් පසු සහ පවාරණ අගයයක් අත්කර ගැනීමෙන් පසු, ආයෝජන ගිණුමෙහි අගයෙන් 25% ක උපරිමයකට සහ රු. විසි පන්දහසක (25,000) අවමයකට යටත්ව මුදල් ලබාගත හැක.

## ඔබට ගැළපෙන ජීවිත රක්ෂණ සැලසුම ඔබම නිර්මාණය කරගන්න



මූල්‍යමය වශයෙන් සුරක්ෂිත හෙට දිනක් වෙනුවෙන් සැලසුම් කිරීමේදී, අප එකිනෙකාට ඇත්තේ අනන්‍ය වූ අවශ්‍යතාවයන් සමූහයකි. Union FlexLife ජීවිත රක්ෂණ සැලසුමක් ආයෝජනය සඳහා තෝරාගන්නා ඔබට, එකී සැලසුම ඔබට අවශ්‍ය පරිදි නිර්මාණය කරගැනීමේ නිදහස, පහසුව සහ නම්‍යශීලීත්වයත් හිමිවේ.

වඩාත් ඉහළ සහ පුළුල් මූල්‍යමය රැකවරණයක් සඳහා අතිරේක ආවරණ ලෙස රෝහල්ගතවීම් ආවරණ, අකර්මණ්‍යතා ආවරණ, ආදායම් අහිමිවීම් ආවරණ සහ අමතර ජීවිත ආවරණ ඔබගේ අභිමතය පරිදි සැලසුමට එක්කර ගත හැක.

## රක්ෂණ සැලසුමට අන්තර්ගත වන ආවරණ*

### මරණ ප්‍රතිලාභය

රක්ෂණ සැලසුම් කාලසීමාව තුළ සිදුවන ජීවිත රක්ෂිතයාගේ අනපේක්ෂිත වියෝවකදී, ප්‍රතිලාභීන්ට මූල්‍යමය රැකවරණය හිමිවේ.

### ජීවිත රක්ෂිතයාගේ වියෝවකදී වාරික ගෙවීමෙන් නිදහස් කිරීමේ ප්‍රතිලාභය

රක්ෂණ සැලසුම් කාලසීමාව තුළ සිදුවන ජීවිත රක්ෂිතයාගේ අනපේක්ෂිත වියෝවකදී, මෙම ප්‍රතිලාභය සක්‍රීය වන අතර අරමුදල බාධාවකින් තොරව වර්ධනය වීමට ඉඩ සලසමින්, කල්පිරීමේදී ආකර්ෂණීය ප්‍රතිලාභයක් හිමිකර දෙයි.

### පූර්ණ නිත්‍ය අකර්මණ්‍යතාවයකදී වාරික ගෙවීමෙන් නිදහස් කිරීමේ ප්‍රතිලාභය

රක්ෂණ සැලසුම් කාලසීමාව තුළ සිදුවන පූර්ණ නිත්‍ය අකර්මණ්‍යතාවයකදී මෙම ප්‍රතිලාභය සක්‍රීය වන අතර, අරමුදල බාධාවකින් තොරව වර්ධනය වීමට ඉඩ සලසමින්, කල්පිරීමේදී ආකර්ෂණීය ප්‍රතිලාභයක් හිමිකර දෙයි.

*රක්ෂණ සැලසුමට අන්තර්ගත වන ආවරණ වර්ග සඳහා වාරික ගෙවීම සිදුකළ යුතු වන්නේ, තෝරාගන්නා වාරික ගෙවීමේ කාලසීමාව තුල පමණි. (සීමිත ගෙවීම් පමණක් අවශ්‍ය වන ආවරණ)

## රක්ෂණ සැලසුමට එක්කර ගත හැකි අතිරේක ආවරණ

### රෝහල්ගතවීම් ආවරණ

රක්ෂණ සැලසුම් කාලසීමාව තුළ ඇතිවන අනපේක්ෂිත රෝහල්ගතවීමකදී, මූල්‍යමය රැකවරණය සපයයි.

### ආදායම් අහිමිවීම් ආවරණ

රක්ෂණ සැලසුම් කාලසීමාව තුළ සිදුවන ජීවිත රක්ෂිතයාගේ අනපේක්ෂිත වියෝවකදී. ආදායම් අහිමිවීම් පියවා ගැනීමට උපකාරී වේ.

### අමතර ජීවිත ආවරණ

රක්ෂණ සැලසුම් කාලසීමාව තුළ සිදුවන ජීවිත රක්ෂිතයාගේ අනපේක්ෂිත වියෝවකදී මූල්‍යමය රැකවරණය සපයයි.

### අකර්මණ්‍යතා ආවරණ

රක්ෂණ සැලසුම් කාලසීමාව තුළ සිදුවන පූර්ණ නිත්‍ය හෝ අර්ධ නිත්‍ය අකර්මණ්‍යතාවයකදී මූල්‍යමය රැකවරණය සපයයි.

**සැලකිය යුතුය:**

- වාරික ගෙවීමේ කාලසීමාව තුළ හදිසි අනතුරක් හේතුවෙන් හෝ ස්වභාවිකව සිදුවන ජීවිත රක්ෂිතයාගේ අනපේක්ෂිත වියෝවකදී, අදාළ වාරික ගෙවීමෙන් නිදහස් කිරීමේ ප්‍රතිලාභය සක්‍රීය වන අතර, මරණ ප්‍රතිලාභය සඳහා අදාළ වන ඉතිරි වාරික ගෙවීම්වලින් නිදහස් කිරීම සිදුවේ.
- පූර්ණ නිත්‍ය අකර්මණ්‍යතාවයක් හේතුවෙන් වාරික ගෙවීමෙන් නිදහස් කිරීමේ ප්‍රතිලාභය සක්‍රීය වන අවස්ථාවකදී, හදිසි අනතුරු මරණ ප්‍රතිලාභය සහ අර්ධ නිත්‍ය අකර්මණ්‍යතා ප්‍රතිලාභය හැර සීමිත ගෙවීම් පමණක් අවශ්‍ය වන අතිරේක ආවරණ සඳහා වන වාරික ගෙවීම්වලින් නිදහස් කෙරේ. තවද, එකී ප්‍රතිලාභය සක්‍රීය වීමකදී, මරණ ප්‍රතිලාභය සහ ජීවිත රක්ෂිතයාගේ වියෝවකදී වාරික ගෙවීමෙන් නිදහස් කිරීමේ ප්‍රතිලාභය සඳහා අදාළ වන වාරික ගෙවීම්වලින්ද නිදහස් කිරීම සිදුවේ.

## තරඟකාරී ලාභාංශ අනුපාත සමඟින් ඔබට ඉහළම ප්‍රතිලාභයක්

ඔබ මිලදී ගන්නා සෑම Union FlexLife ජීවිත රක්ෂණ සැලසුමක් සමඟින්, ඔබටම අනන්‍ය ආයෝජන ගිණුමක් විවෘත වේ. එකී ආයෝජන ගිණුම, ඔබ ආයෝජනය කරන වාරික සහ යුනියන් ඇෂුවරන්ස් සමාගම විසින් ප්‍රකාශයට පත්කරනු ලබන තරඟකාරී ලාභාංශ අනුපාත සමඟ, සැලසුම් කාලසීමාව පුරා සෑම මාසයකම වර්ධනය වනු ඇත.

| වර්ෂය | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| වර්ෂය සඳහා සහතික කළ අවම ලාභාංශ අනුපාතය | 8.00% | 10.00% | 10.00% | 10.00% | 9.00% | 8.00% | 9.00% | 9.00% | 10.00% | 9.00% |
| ප්‍රකාශිත සැබෑ ලාභාංශ අනුපාතය | 10.50% | 10.25% | 10.00% | 10.00% | 9.00% | 8.00% | 10.00% | 13.50% | 12.00% | 11.00% |

**සැලකිය යුතුයි:**

- වර්ෂය ආරම්භයේදී සහතික කරන අවම ලාභාංශ අනුපාතයක් එකී වසර තුළදී පුද්ගල අරමුදල් වෙත මාසිකව බැර කෙරෙනු ඇත. බැර කිරීමට නියමිත සැබෑ ලාභාංශ අනුපාතය සෑම වසරකම අවසානයේ තීරණය කරනු ලබන අතර, එය සමස්ත ජීවිත අරමුදලේ සැබෑ කාර්යසාධනය මත රඳා පවතිනු ඇත. කුමන අවස්ථාවක වුවද, සැබෑ ප්‍රකාශිත ලාභාංශ අනුපාතය සහතික කරන ලද අවම ලාභාංශ අනුපාතයට වඩා අඩු නොවනු ඇත.
- යුනියන් ඇෂුවරන්ස් විසින් සහතික කරන ලද අවම ලාභාංශ සහ ප්‍රකාශිත ලාභාංශ අනුපාතයන් සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න. නොඑසේනම් unionassurance.com/sinhala/dividend-returns හරහා අපගේ වෙබ් අඩවියට පිවිසෙන්න.

ප්‍රකාශිත ලාභාංශ අනුපාතයන් සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න.

## ඇතුළත්වීමේ සුදුසුකම් සහ සැලසුම් තොරතුරු

**ඇතුළත්වීමේ අවම වයස**
අවුරුදු 18 (ආසන්නතම උපන්දිනය)

**ඇතුළත්වීමේ උපරිම වයස**
අවුරුදු 60 (ආසන්නතම උපන්දිනය)

**ආවරණය අවසන් වන වයස**
අවුරුදු 70 (නිශ්චිත)

**රක්ෂණ සැලසුම් කාලසීමාව**
අවුරුදු 10-40

**වාරික ගෙවිය යුතු කාලසීමාව**
අවුරුදු 5 | අවුරුදු 7 අවුරුදු 10

**වාරික ගෙවිය හැකි ක්‍රම**
මාසික | කාර්තුමය | අර්ධ- වාර්ෂික | වාර්ෂික

**සැලකිය යුතුයි:**

- අතිරේක ආවරණ සඳහා ආවරණ කාලසීමාව වසර 10 සිට 30 දක්වා වේ.
- වසර 7 ක් සහ වසර 10 ක් සඳහා වාරික ගෙවීමට මිලදී ගන්නා Union FlexLife ජීවිත රක්ෂණ සැලසුම් සඳහා තෝරාගත යුතු අවම සැලසුම් කාලසීමාව වසර 15 ක් සහ වසර 20 ක් වේ.



යුනියන් ඇෂුවරන්ස් ජෝන් කීල්ස් සමාගමකි

# ඔබගේ Union FlexLife ජීවිත රක්ෂණ සැලසුම ක්‍රියාත්මක වන අයුරු

## ජීවිත රක්ෂිතයා රක්ෂණ සැලසුම් කාලසීමාව සම්පූර්ණ කිරීමකදී



අමල්, වයස අවුරුදු 35 ක් වන විවාහකයෙකු වේ. ඔහු Union FlexLife රක්ෂණ සැලසුමක් වසර 20 ක් සඳහා මිලදී ගන්නා අතර වාරික ගෙවීමේ කාලසීමාව ලෙස වසර 7 තෝරාගනී.

| | |
|---|---|
| රක්ෂණ සැලසුම් කාලසීමාව: වසර 20 | මරණ ප්‍රතිලාභය: රු. 900,000 |
| වාරික ගෙවිය යුතු කාලසීමාව: වසර 07 | වාර්ෂික වාරික මුදල: රු. 137,522 |

පෙන්වා ඇති ලාභාංශ අනුපාත යටතේ අමල්ගේ ආයෝජන අරමුදල වර්ධනය වීමකදී, අපේක්ෂා කළ හැකි කල්පිරීමේ ප්‍රතිලාභ අගයන් පහත පරිදි වේ.

කල්පිරීමේ ප්‍රතිලාභය එකවර මුළු මුදලක් ලෙස ලබාගැනීමට තීරණය කරන අවස්ථාවකදී:

| වයස | රක්ෂණ සැලසුම් කාලසීමාව | මරණ ප්‍රතිලාභය (රු.) | වාර්ෂික වාරික මුදල (රු.) | අපේක්ෂිත කල්පිරීමේ ප්‍රතිලාභය (රු.) (ප්‍රසාද දීමනාව ඇතුළත්ව) | | |
|---|---|---|---|---|---|---|
| | | | | 8% | 10% | 12% |
| 35 | 20 | 900,000 | 137,522 | 2,444,000 | 3,298,000 | 4,446,000 |

කල්පිරීමේ ප්‍රතිලාභය කොටස් වශයෙන් මාසික ආදායමක් ලෙස වසර 10 ක් සඳහා ලබාගැනීමට තීරණය කරන අවස්ථාවකදී:

| වයස | රක්ෂණ සැලසුම් කාලසීමාව | මරණ ප්‍රතිලාභය (රු.) | වාර්ෂික වාරික මුදල (රු.) | හිමිවන මුළු ප්‍රතිලාභ වටිනාකම (රු.) | | |
|---|---|---|---|---|---|---|
| | | | | 8% | 10% | 12% |
| 35 | 20 | 900,000 | 137,522 | 3,440,000 | 5,147,000 | 7,701,000 |

**සැලකිය යුතුයි:**

- ඉහත නිරූපිත අගයයන් ගණනය කොට ඇත්තේ රක්ෂණ සැලසුම් කාලසීමාව පුරාවට යූනියන් ඇෂුවරන්ස් සමාගම විසින් 10% ක ලාභාංශයක් ප්‍රකාශයට පත්කරන බව උපකල්පනය කරමිනි. අපේක්ෂා කළ හැකි සැබෑ ප්‍රතිලාභ අගයයන්, සැලසුම ආරම්භයේදී වයස සහ යූනියන් ඇෂුවරන්ස් සමාගම විසින් ප්‍රකාශයට පත්කරනු ලබන සැබෑ ලාභාංශ අගයයන් මත පදනම් වේ.
- ඉහත පෙන්වා ඇති වාරික අගයයන් හරහා මරණ ප්‍රතිලාභය, ජීවිත රක්ෂිතයාගේ අනපේක්ෂිත වියෝවකදී වාරික ගෙවීමෙන් නිදහස් කිරීමේ ප්‍රතිලාභය සහ පූර්ණ නිත්‍ය අකර්මණ්‍යතාවයකදී වාරික ගෙවීමෙන් නිදහස් කිරීමේ ප්‍රතිලාභය යන ප්‍රතිලාභ පමණක් ආවරණය වේ. අතිරේක ආවරණ රක්ෂණ සැලසුමට එක්කර ගැනීමකදී වාරික අගයයන් ඉහත නිරූපිත අගයයන්ගෙන් වෙනස් වනු ඇත.

## වාරික ගෙවිය යුතු කාලසීමාවෙන් අනතුරුව සිදුවන ජීවිත රක්ෂිතයාගේ අනපේක්ෂිත වියෝවකදී




අමල්, වයස අවුරුදු 35 ක් වන විවාහකයෙකු වේ. ඔහු Union FlexLife රක්ෂණ සැලසුමක් වසර 20 ක් සඳහා මිලදී ගන්නා අතර වාරික ගෙවීමේ කාලසීමාව ලෙස වසර 7 තෝරාගනී.

තවද, කල්පිරීමේ ප්‍රතිලාභය රක්ෂණ සැලසුම අවසානයේදී මුළු මුදලක් ලෙස එකවර ලබා ගැනීමට අමල් තීරණය කරයි.

| | |
|---|---|
| රක්ෂණ සැලසුම් කාලසීමාව: වසර 20 | මරණ ප්‍රතිලාභය: රු. 900,000 |
| වාරික ගෙවිය යුතු කාලසීමාව: වසර 07 | වාර්ෂික වාරික මුදල: රු. 137,522 |
| කල්පිරීමේ ප්‍රතිලාභය ලබාගන්නා අයුරු: එකවර මුළු මුදලක් ලෙස | |

වාරික ගෙවිය යුතු කාලසීමාවෙන් පසුව සිදුවන අමල්ගේ අනපේක්ෂිත වියෝවකදී, ඔහුගේ ප්‍රතිලාභීන්ට මූල්‍යමය රැකවරණය සහ සැලසුම අවසානයේ කල්පිරීමේ ප්‍රතිලාභය පිරිනමන අයුරු පහත නිරූපණයෙන් පෙන්නුම් කෙරේ.




**සැලකිය යුතුය:**

- ඉහත නිරූපිත අගයයන් ගණනය කොට ඇත්තේ රක්ෂණ සැලසුම් කාලසීමාව පුරාවට යුනියන් ඇෂුවරන්ස් සමාගම විසින් 10% ක ලාභාංශයක් ප්‍රකාශයට පත් කරන බව උපකල්පනය කරමිනි. අපේක්ෂා කළ හැකි සැබෑ ප්‍රතිලාභ අගයයන්, සැලසුම ආරම්භයේදී වයස සහ යුනියන් ඇෂුවරන්ස් සමාගම විසින් ප්‍රකාශයට පත්කරනු ලබන සැබෑ ලාභාංශ අගයයන් මත පදනම් වේ.
- ඉහත පෙන්වා ඇති වාරික අගයයන් හරහා මරණ ප්‍රතිලාභය, ජීවිත රක්ෂිතයාගේ අනපේක්ෂිත වියෝවකදී වාරික ගෙවීමෙන් නිදහස් කිරීමේ ප්‍රතිලාභය සහ පූර්ණ නිත්‍ය අකර්මණ්‍යතාවයකදී වාරික ගෙවීමෙන් නිදහස් කිරීමේ ප්‍රතිලාභය යන ප්‍රතිලාභ පමණක් ආවරණය වේ. අතිරේක ආවරණ රක්ෂණ සැලසුමට එක්කර ගැනීමකදී වාරික අගයයන් ඉහත නිරූපිත අගයයන්ගෙන් වෙනස් වනු ඇත.

### රක්ෂණ සැලසුම් කාලසීමාව තුළ ජීවිත රක්ෂිතයා හට ඇතිවන පූර්ණ නිත්‍ය අකර්මණ්‍යතාවයකදී




අමල්, වයස අවුරුදු 35 ක් වන විවාහකයෙකු වේ. ඔහු Union FlexLife රක්ෂණ සැලසුමක් වසර 20 ක් සඳහා මිලදී ගන්නා අතර වාරික ගෙවීමේ කාලසීමාව ලෙස වසර 7 තෝරාගනී.

තවද, තම කල්පිරීමේ ප්‍රතිලාභය කොටස් වශයෙන් මාසික ආදායමක් ලෙස වසර 10 ක් පුරාවට ලබාගැනීමට අමල් තීරණය කරයි.

| | |
|---|---|
| රක්ෂණ සැලසුම් කාලසීමාව: වසර 20 | මරණ ප්‍රතිලාභය: රු. 900,000 |
| වාරික ගෙවිය යුතු කාලසීමාව: වසර 07 | වාර්ෂික වාරික මුදල: රු. 137,522 |
| කල්පිරීමේ ප්‍රතිලාභය ලබාගන්නා අයුරු: කොටස් වශයෙන් මාසික ආදායමක් ලෙස | ප්‍රතිලාභ ලබාගැනීමට අපේක්ෂිත කාලය: වසර 10 |

වාරික ගෙවිය යුතු කාලසීමාව තුළ අමල් මුහුණදෙන අනපේක්ෂිත පූර්ණ සහ නිත්‍ය අකර්මණ්‍යතාවයකදී, ඔහුට සහ ඔහුගේ ආදරණීයයන්ට මූල්‍යමය රැකවරණය Union FlexLife හරහා හිමිවන අයුරු පහත නිරූපණයෙන් පෙන්නුම් කෙරේ.




**සැලකිය යුතුයි:**

- ඉහත නිරූපිත අගයයන් ගණනය කොට ඇත්තේ රක්ෂණ සැලසුම් කාලසීමාව පුරාවට යුනියන් ඇෂුවරන්ස් සමාගම විසින් 10% ක ලාභාංශයක් ප්‍රකාශයට පත් කරන බව උපකල්පනය කරමිනි. අපේක්ෂා කළ හැකි සැබෑ ප්‍රතිලාභ අගයයන්, සැලසුම ආරම්භයේදී වයස සහ යුනියන් ඇෂුවරන්ස් සමාගම විසින් ප්‍රකාශයට පත්කරනු ලබන සැබෑ ලාභාංශ අගයයන් මත පදනම් වේ.
- ඉහත පෙන්වා ඇති වාරික අගයයන් හරහා මරණ ප්‍රතිලාභය, ජීවිත රක්ෂිතයාගේ අනපේක්ෂිත වියෝවකදී වාරික ගෙවීමෙන් නිදහස් කිරීමේ ප්‍රතිලාභය සහ පූර්ණ නිත්‍ය අකර්මණ්‍යතාවයකදී වාරික ගෙවීමෙන් නිදහස් කිරීමේ ප්‍රතිලාභය යන ප්‍රතිලාභ පමණක් ආවරණය වේ. අතිරේක ආවරණ රක්ෂණ සැලසුමට එක්කර ගැනීමකදී වාරික අගයයන් ඉහත නිරූපිත අගයයන්ගෙන් වෙනස් වනු ඇත.

# අතිරේක ආවරණ

1. **වාරික ගෙවිය යුතු කාලසීමාව අවසන් වන තුරු වාරික ගෙවිය යුතු අතිරේක ආවරණ (සීමිත ගෙවීම් අවශ්‍ය වන අතිරේක ආවරණ)**

### අකර්මණ්‍යතා ආවරණ

මෙම අකර්මණ්‍යතා ආවරණ රක්ෂණ සැලසුම් කාලසීමාව තුළ සිදුවන පූර්ණ හෝ අර්ධ නිත්‍ය අකර්මණ්‍යතාවකදී මූල්‍යමය රැකවරණය සපයයි.

| | |
|---|---|
| පූර්ණ නිත්‍ය අකර්මණ්‍යතා ප්‍රතිලාභය (හදිසි අනතුරක් හේතුවෙන්) (සීමිත ගෙවීම්) | රක්ෂණ සැලසුම් කාලසීමාව තුළ හදිසි අනතුරක් හේතුවෙන් සිදුවන පූර්ණ සහ නිත්‍ය අකර්මණ්‍යතාවයකදී මෙම අතිරේක ආවරණය යටතේ රක්ෂිත මුදල සමාන වාරික 5 කින් ගෙවනු ලැබේ. |
| අර්ධ නිත්‍ය අකර්මණ්‍යතා ප්‍රතිලාභය (සීමිත ගෙවීම්) | රක්ෂණ සැලසුම් කාලසීමාව තුළ හදිසි අනතුරක් හේතුවෙන් සිදුවන අර්ධ සහ නිත්‍ය අකර්මණ්‍යතාවයකදී මෙම අතිරේක ආවරණය යටතේ රක්ෂිත මුදලින් ප්‍රතිශතයක් ගෙවනු ලැබේ. |

### අතිරේක ජීවිත ආවරණ

මෙම අතිරේක ජීවිත ආවරණ, රක්ෂණ සැලසුම් කාලසීමාව තුළ සිදුවන ජීවිත රක්ෂිතයාගේ වියෝවකදී, මරණ ප්‍රතිලාභයෙන් ඔබ්බට ගොස් අතිරේක මූල්‍යමය රැකවරණයක් හිමිකර දෙයි.

| | |
|---|---|
| සමකාල ප්‍රතිලාභය (සීමිත ගෙවීම්) | සුළු අමතර වාරිකයකින්, ඔබේ මරණ ප්‍රතිලාභය 20 ගුණයක් දක්වා ඉහළ නංවා ගැනීමට මෙම අතිරේක ආවරණය හරහා අවස්ථාව හිමිවේ. |
| හදිසි අනතුරු මරණ ප්‍රතිලාභය (සීමිත ගෙවීම්) | රක්ෂණ සැලසුම් කාලසීමාව තුළ හදිසි අනතුරක් හේතුවෙන් සිදුවන ජීවිත රක්ෂිතයාගේ වියෝවකදී, මරණ ප්‍රතිලාභයට අමතරව, මෙම අතිරේක ආවරණය යටතේ රක්ෂිත මුදල එකවර ගෙවනු ලැබේ. |
| සහකරුගේ ජීවිතය මත සමකාල ප්‍රතිලාභය (සීමිත ගෙවීම්) | රක්ෂණ සැලසුම් කාලසීමාව තුළ සිදුවන ඔබගේ සහකරු හෝ සහකාරියගේ අනපේක්ෂිත වියෝවකදී, මෙම අතිරේක ආවරණය හරහා මූල්‍යමය රැකවරණය හිමිවේ. |
| අවමංගල්‍ය වියදම් ප්‍රතිලාභය (සීමිත ගෙවීම්) | රක්ෂණ සැලසුම් කාලසීමාව තුළ සිදුවන ජීවිත රක්ෂිතයාගේ අනපේක්ෂිත වියෝවකදී, අවමංගල්‍ය වියදම් මෙම ආවරණය යටතේ ආවරණය කෙරේ. |

### ආදායම් අහිමිවීම් ආවරණ

මෙම අතිරේක ආවරණ රක්ෂණ සැලසුම් කාලසීමාව තුළ සිදුවන ජීවිත රක්ෂිතයාගේ අනපේක්ෂිත වියෝවකදී, ආදායම් අහිමිවීම් පියවා ගැනීමට උපකාරී වේ.

| | |
|---|---|
| පවුල් ආදායම් ප්‍රතිලාභය (සීමිත ගෙවීම්) | ජීවිත රක්ෂිතයාගේ අනපේක්ෂිත වියෝවකදී, ආදායම් අහිමිවීම් හේතුවෙන් ඇතිවන මූල්‍යමය අපහසුතාවලින් පවුලේ සාමාජිකයන්ට සහනය සැලසීම සඳහා, රක්ෂණ සැලසුම් කාලසීමාව අවසන් වන තුරු මෙම ආවරණය යටතේ රක්ෂිත මුදල කාර්තුමය ගෙවීම් ලෙස ප්‍රතිලාභීන්ට ලබාදෙනු ලැබේ. |

2. රක්ෂණ සැලසුම් කාලසීමාව සහ අතිරේක ආවරණ කාලසීමාව යන දෙකෙන් මුලින් පැමිණෙන කාලසීමාව සඳහා වාර්ික ගෙවිය යුතු අතිරේක ආවරණ (සාමාන්‍ය ගෙවීම් අවශ්‍ය වන අතිරේක ආවරණ)

### රෝහල්ගතවීම් ආවරණ

මෙම අතිරේක ආවරණ රක්ෂණ සැලසුම් කාලසීමාව තුළ ඇතිවන අනපේක්ෂිත රෝහල්ගතවීමකදී, අත්‍යවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර නිසි අවස්ථාවේදී ලබාගැනීම සඳහා අවශ්‍ය වන මූල්‍යමය රැකවරණය සපයයි.

| | |
|---|---|
| යූනියන් හෙල්ත් 360 ප්‍රතිලාභය | ඔබගේ සියලුම සෞඛ්‍ය රක්ෂණ අවශ්‍යතා සපුරන මෙම සුවිශේෂී අතිරේක ආවරණය ඔබගේ රක්ෂණ සැලසුමට එක්කර ගැනීමෙන් ශ්‍රී ලංකාව හෝ ලොව පුරා (ඇමෙරිකා එක්සත් ජනපදය සහ කැනඩාව හැර) රෝගාබාධයක් හෝ ශල්‍යකර්මයක් සඳහා වන රෝහල්ගතවීමකදී වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය කළ හැකිය. තවද වඩාත් ඉහළ මූල්‍යමය රැකවරණයක් සඳහා අතිරේක ආවරණ ලෙස මාතෘ ප්‍රතිලාභ සහ අතිරේක අක්ෂි ප්‍රතිලාභ එක්කර ගත හැකිය. |
| යූනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රිමියර් ප්‍රතිලාභය | ප්‍රතිලාභ රැසක් සමඟින් පැමිණෙන මෙම අතිරේක ආවරණය හරහා, ජීවිත රක්ෂිතයා, ජීවිත රක්ෂිතයාගේ දෙමව්පියන් සහ වයස අවුරුදු 23 ට අඩු දරුවන් සඳහා වන රෝහල්ගතවීමකදී වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය කළ හැකිය. |
| රෝහල් දීමනා ප්‍රතිලාභය | රෝහල්ගතවීමකදී, අමතර වෛද්‍ය වියදම් පියවා ගැනීම සඳහා රක්ෂණ ඔප්පුවෙහි සඳහන් කර ඇති පරිදි, මෙම අතිරේක ආවරණය යටතේ රක්ෂිත මුදල දෛනික ප්‍රතිලාභයක් ලෙස ගෙවනු ලැබේ. |
| ළමා රෝහල් දීමනා ප්‍රතිලාභය | ජීවිත රක්ෂිතයාගේ දරුවෙකුගේ, රෝහල්ගතවීමකදී, අමතර වෛද්‍ය වියදම් පියවා ගැනීම සඳහා රක්ෂණ ඔප්පුවෙහි සඳහන් කර ඇති පරිදි, මෙම අතිරේක ආවරණය යටතේ රක්ෂිත මුදල දෛනික ප්‍රතිලාභයක් ලෙස ගෙවනු ලැබේ. |
| සුවමග ප්‍රතිලාභය | බරපතළ රෝගාබාධයකදී වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම සඳහා මූල්‍ය ප්‍රතිලාභ එකවර ලබාදේ. |
| පූර්ණ සැත්කම් ප්‍රතිලාභය | හදිසි අනතුරකදී හෝ රෝගාබාධයකදී සිදුකළ යුතු ශල්‍යකර්මයක් සඳහා අවශ්‍ය වන මූල්‍යමය සහය සපයයි. |
| ළමා සෞඛ්‍ය ප්‍රතිලාභය | රෝහල්ගතවීමකදී දෛනික මූල්‍යමය ප්‍රතිලාභ ලබාදෙන අතරම, ළමුන් සඳහා සැත්කම් 244 ක් දක්වා ආවරණය කරනු ලබයි. |

### අකර්මණ්‍යතා ආවරණ

රක්ෂණ සැලසුම් කාලසීමාව තුළ සිදුවන පූර්ණ සහ නිත්‍ය අකර්මණ්‍යතාවයකදී මූල්‍යමය රැකවරණය සපයයි.

| | |
|---|---|
| පූර්ණ නිත්‍ය අකර්මණ්‍යතා ප්‍රතිලාභය (හදිසි අනතුරක් හෝ රෝගාබාධයක් හේතුවෙන්) | රක්ෂණ සැලසුම් කාලසීමාව තුළ හදිසි අනතුරක් හෝ රෝගාබාධයක් හේතුවෙන් සිදුවන පූර්ණ සහ නිත්‍ය අකර්මණ්‍යතාවයකදී මෙම අතිරේක ආවරණය යටතේ රක්ෂිත මුදල සමාන වාර්ික 5 කින් ගෙවනු ලැබේ. |

**සැලකිය යුතුයි:**

- මෙම රක්ෂණාවරණය මගින් ආවරණය කරනු ලබන බරපතළ රෝගාබාධ තත්වයන් පිලිබඳ සම්පූර්ණ තොරතුරු සහ අර්ථ දැක්වීම් සඳහා කරුණාකර රක්ෂණ ඔප්පුව වෙත යොමු වන්න.
- මෙම අත්පත්‍රිකාව පිළියෙළ කර ඇත්තේ තොරතුරු ලබාදීම සඳහා පමණි. මෙය ගිවිසුමක් හෝ රක්ෂණ ඔප්පුවක් නොවේ.

**ප්‍රතිලාභ, බැහැරකිරීම්, කොන්දේසි සහ නියමයන් සඳහා කරුණාකර රක්ෂණ ඔප්පුව හොඳින් කියවන්න.**

යූනියන්
ඇෂුවරන්ස්
ජෝන් කීල්ස් සමාගමකි


යූනියන් ඇෂුවරන්ස් පී.එල්.සී. (PQ 12)
නො. 20, ශාන්ත මයිකල් පාර,
කොළඹ 03, ශ්‍රී ලංකාව.

1330 (24x7 ක්ෂණික ඇමතුම්)
011 2990 990

unionassurance.com
info@unionassurance.com


අප හා සම්බන්ධ වන්න


යූනියන් ඇෂුවරන්ස් පීඑල්සී සමාගම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ (IRCSL) බලපත්‍රලාභී රක්ෂණ ආයතනයකි.
UA PM 80 S යූනියන් ඇෂුවරන්ස් පී.එල්.සී (PQ 12) විසින් 05/2026 නිකුත් කරන ලදී"